## දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
## ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
## අම්පාර.
## 2018.09.13

දිස්ත්‍රික්කය :- අම්පාර

01. පිළිගැනීමේ කථාව :-

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ආරම්භ කරමින් අම්පාර නව දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා විසින් කමිටුවට සහභාගී වී සිටි සම සභාපතිවරුන් වන ගරු ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමන්, සම සභාපති දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.අයි.එම්. මන්සූර් මැතිතුමන්, සම සභාපති දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. කොඩීශ්වරන් මැතිතුමන්, ගරු සම සභාපති එම්.එස්. උදුමාලෙබ්බේ මැතිතුමන්, ගරු. සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය ෆයිසාල් කාසිම් මැතිතුමන්,ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී විමලවීර දිසානායක මැතිතුමන්, ගරු නැගෙනහිර පළාත් සභා සභාපති චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමන්, ගරු නාගරික කොමසාරිතුමන්ලා ගරු නගර සභා සභාපතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ද, දිස්ත්‍රික්කයේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද, නියෝජ්‍ය පොලිස්පති තුමන්, නාවික හමුදාව, ගුවන් හමුදාව, විශේෂ කාර්ය බලකාය නියෝජනය කරමින් පැමින සිටි ත්‍රිවිධ හමුදා නිලධාරීන්ද, සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ද, මාධ්‍යවේදීන්ද ඇතුළුව සහභාගී වී සිටි සියළු දෙනා ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදි.

මෙහි දී නව දිසාපතිතුමන් විසින් වැඩිදුරටත් අදහස් දක්වමින් කියා සිටිනු ලැබුවේ විවිධ ක්ෂේත්‍රයන්හි රාජ්‍ය සේවයේ වසර 34 ක අත්දැකීම් දිස්ත්‍රික්කයේ සංවර්ධනය උදෙසා යොදා ගැනීමට හැකි වන බවත්, වෙනත් දිස්ත්‍රික්කවල සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ගණනාවක අත්දැකීම් තුළින් තමන්වද මෙම දිස්ත්‍රික්කයේ සංවර්ධනය උදෙසා ඇති වගකීම මැනවින් ඉටුකර ගැනීමට පහසුවන බවයි. සාමය,සහජීවනය හා සංහිඳියාව තුළින් විවිධ ජාතින් සහෝදරත්වයෙන් ජීවත් වන ලංකාවේ ඉතාම වැදගත් දිස්ත්‍රික්කයක් වන අම්පාර දිස්ත්‍රික්කය සම්පත් බහුල දිස්ත්‍රික්කයක් වන බැවින් අනෙකුත් දිස්ත්‍රික්ක අභිබවා මෙම දිස්ත්‍රික්කය සංවර්ධනය කරා යෑම අප සියළු දෙනාගේම ඒකායන අභිප්‍රාය බව පෙන්වා දෙන ලදි. එමෙන්ම, නිෂ්පාදනය වැඩි කිරීම,දුප්පත්කම පිටුදැකීම, ආදායම් වැඩිකිරීම පිටස්තර මුදල් දිස්ත්‍රික්කයට ගෙන්වා ගැනීම, භෞතික සම්පත් සංවර්ධනය හා සංරක්ෂණය යන ඉලක්කයන් සපුරාගැනීම උදෙසා සියළු දෙනාගේ සහයෝගය සහ දේශපාලන අධිකාරියේ අවශ්‍ය මග පෙන්වීම ලබා දෙන ලෙසද ඉල්ලා සිටින ලදි. එසේම, මෙතෙක් නොවිසඳුන බොහෝ ගැටළු විශාල වශයෙන් අධ්‍යයන කළ යුතු බවත්, දිස්ත්‍රික්කයට තමන් පැමිණ එපමණ කාලයක් නොවන නිසා සංවර්ධන කටයුතු වලට බාධාවක් නොවන ආකාරයට ගැටළු හා බාධකයන් විසඳමින් කටයුතු කරන බව වැඩි දුරටත් සඳහන් කරමින් සභාවේ ඉදිරි කටයුතු කමිටුවේ සම සභාපතිවරුන් වෙත භාර කරන ලදි.

02. 2.1 <u>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම ගරු සම සභාපතිවරුන්ගේ කථාව.</u>
<u>සභාපති සමාජ සුභසාධනහා ප්‍රාථමික කර්මාන්ත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා.</u>

ගරු සමාජ සුබ සාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය, අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති දයා ගමගේ මැතිතුමන් විසින් සියළුම සම සභාපතිවරුන් වෙනුවෙන් නව දිසාපති තුමන් අම්පාර දිස්ත්‍රික්කයට පිළිගනිමින් හා සුභාශිංසන ගෙනෙමින් කියා සිටියේ දිසාපතිතුමන් ගේ දැක්ම ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන බවයි.

03. 2018.06.25 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගත් තීරණ පිලිබඳ සාකච්ඡා කිරීම

| # | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විෂය | වගකීම් දරණ නිලධාරින්/ ආයතනය |
|---|---|---|---|
| 1 | අම්පාර | **නාමල්ඔය කොළඹ කොටසේ 2බී 178 කුඹුරු ඉඩම ආසන්යේ සිට 2බී සහ 3බී ජනපද වෙන්වන ප්‍රධාන කුණු ඇළ නාමල් ගහ දක්වා ගොඩ දැමීම සහ 177 හා 178 ඉඩම් දෙක වෙන්වන කුණු ඇළ ගොඩ දැමීම**<br>*(සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා)*<br>අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සඳහන් කලේ මෙම කුණු ඇළ ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීමට සැලැස්මක් නොමැති බවත් 2001 වර්ෂයේ මීට අදාළව දිසා අධිකරණය නඩුවක් ගොනු කර තිබූ බවත් ය.කෙසේ වෙතත් මෙම කුණු ඇළ ඉවත් කල නොහැකි බව ගරු දයාගමගේ ඇමතිතුමා විසින් පෙන්වා දුන් අතර මෙම ගැටළුව මී ලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට නොගෙන විසඳුමක් ලබා ගන්නා ලෙසට වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත කමිටුව විසින් යෝජනා කරන ලදි. | වාරිමාර්ග අධ්‍යක්ෂ, අම්පාර |
| 2 | අම්පාර | **ජාතික ඒකාබද්ධ හා ප්‍රතිසංධාන අමාත්‍යාංශය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ තොරතුරු**<br>*(අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති එම්.එස්.උදුමා ලෙබ්බෙ මැතිතුමා)*<br>පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නියෝජනයක් නොවූ බැවින් මී ලඟ කමිටු සභා රැස්වීමේ දී සාකච්ඡාවට යොමු කරන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය / ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් පාලන සහකාර කොමසාරිස්, අම්පාර |
| 3 | අම්පාර | **1996 වර්ෂයේ ආරම්භ කරන ලද එක්ගල්ඔය තරුණ ව්‍යාපාරයේ ගොවීන්ට මුලින් ලබා දී තිබූ ගොඩ ඉඩම් අක්කර 03 වෙනුවට අක්කර 01 බැගින් ලබා දීමට කටයුතු කිරීම.**<br>*(සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා)*<br><br>මෙහි දී ගරු සම සභාපති දයා ගමගේ මැතිතුමන් විසින් සඳහන් කරන ලද්දේ දමන ප්‍රාදේශීය ලේකම් පෙන්වා දුන් ආකාරයට මුලින් අක්කර 03 බැගින් ලබා දුන්නත් ජනගහණය හා පවතින භූමි ප්‍රමාණය අනුව අක්කර 01 බැගින් ලබා දිම සුදුසු බවයි. නැගෙනහිර පළාත් සභාවේ ගරු සභාපති චන්ද්‍රදාස ගලප්පත්ති මහතා විසින්, සංවර්ධනය කළ ඉඩම් හැර සංවර්ධනය නොකළ ඉඩම් මේ සඳහා යොදා ගත යුතු බව සඳහන් කරන ලදි. එය ඒ ආකාරයටම සිදු වන බව ගරු සම සභාපති දයා ගමගේ මැතිතුමන් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි. | සහකාර ඉඩම් කොමසාරිස්, අම්පාර / ප්‍රාදේශීය ලේකම්, දමන |
| 4 | පොතුවිල් | **ආරුගම්බේ වෙරළේ බෝට්ටු නවතා තැබීමට තොටුපළ ඉදි කිරීමට ස්ථිර ස්ථානයක් වෙන් කර ගැනීම.**<br>*(අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති එම්.එස්.උදුමා ලෙබ්බෙ මැතිතුමා)*<br>පොතුවිල් ප්‍රාදේශී ය ලේකම් තුමන් විසින් සඳහන් කරන ලද්දේ 2018.09.12 දින විශේෂ සාකච්ඡාවක් *දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති එම්.එස්.උදුමා ලෙබ්බෙ මැතිතුමා,* ප්‍රාදේශීය ලේකම් පොතුවිල්,සහකාර අධ්‍යක්ෂ ධීවර හා ෂීපා ආයතනය යන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් | ප්‍රාදේශීය ලේකම්, පොතුවිල්. |

| | | | |
|---|---|---|---|
| | | පවත්වා අදාළ තොටුපළ ඉදිකිරීමට සුදුසු ස්ථානයක් වෙන් කරනලද බවත් එහි ඉදිරි කටයුතු ධීවර දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමටත් අපේක්ෂිත බව පෙන්වා දෙන ලදි මේ පිළිබඳ තොරතුර ඉදිරිපත් කිරීමට අනිවාර්යයෙන් සහකාර අධ්‍යක්ෂ ධීවර සහභාගීවිය යුතු බව ගරු සම සභාපති උදුමාලෙබ්බේ මැතිතුමා අවධාරණය කරන ලදි. | |
| 5 | එරගම | **එරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නාවලඩිවට්ටෙයි කුඹුරු ඉඩම් පිළිබඳ ගැටළුව**<br>*(අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති එම්.එස්.උදුමා ලෙබ්බේ මැතිතුමා)*<br>ගැටළුව නිරාකරණය වී ඇති බව එරගම ප්‍රාදේශීය ලේකම් විසින්කමිටුව දැනුවත් කරන ලදි. | ප්‍රාදේශීය ලේකම්,එරගම/දමන |
| 6 | දමන | **දමන සිට පල්ලංඔය දක්වා ඉදිවෙන මාර්ගයේ අබලන් තත්ත්වය හා එහි ඉතිරි සංවර්ධන කටයුතු සම්බන්ධව**<br>I ROAD ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත බව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දන්වා සිටින ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |

04. 2018.06.25 දින පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ වාර්තාව අනුමත කර ගැනීම සිදු කරන ලදි.

05. 2018.09.14 පැවැත්වූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ න්‍යාය පත්‍රය සඳහා ඉදිරිපත් කළ යෝජනා

| # | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විෂය | වගකීම් දරණ නිලධාරීන්/ ආයතනය |
|---|---|---|---|
| 1 | මහඔය | **මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමගිපුර ග්‍රාමයේ පිල්ඩර් වතු යායේ පදිංචි ජනතාවට තමන් පදිංචිව සිටින ඉඩම් සඳහා අයිතිය පිළිබඳව සාකච්ඡා කිරීම**<br>(ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විමලවීර දිසානායක මැතිතුමා)<br>**මහඔය සමගිපුර ග්‍රාම නිලධාරී වසමේ පිල්ඩර් වත්ත ඉඩම් හිමියන්ගෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් මුදල් අය කිරීම**<br>(සභාපති, ප්‍රාදේශීය සභාව, මහඔය)<br>මහඔය ප්‍රාදේශීය සභාවේ සභාපති තුමන් විසින් පෙන්වා දෙන ලැබුවේ පිල්ඩර් වතුයායේ පදිංචි නිවාස හිමියන්ගෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් රු. 40,000.00,50,000.00 මුදලක් අය කර ගන්නා බවට ලිපි මගින් දන්වා ඇති බවයි. ඉඩම් ඔප්පු ලබා දීමට අදාළව මහඔය ප්‍රාදේශීය ලේකම් ඉදිරිපත් කර ඇති නාම ලේඛණයට අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් 1994 සිට 2015 වර්ෂය දක්වා ඉඩම් පරිහරණ ගාස්තු ගේවා නොමැති අයවළුන් සඳහා ලිපි යවා ඇති බැව් ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති දයා ගමගේ මැතිතුමන් විසින් අදාළ ලිපි පරීක්ෂාවෙන් පසු පවසන ලදි. එනමුත්, ඉඩම් ඔප්පු හිමියන්ටද මෙම අයකිරීම් වලට අදාළ ලිපි යවා ඇති බව මහඔය ප්‍රාදේශීය සභා සභාපති වරයා පවසන ලදි. ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව අවුරුද දෙක තුනක සිට නිසාදනපත්‍ර සකස් කර නොමැති බවත්මෙම ප්‍රමාදය හේතුවෙන් පරිහරණ ගාස්තු ගෙවා ඇති අයට අසාධාරණයක් සිදුවන බව | සහකාර අධ්‍යක්ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශ කරන ලදි.<br>එහිදී ගරු ඇමතිතුමන් විසින් ප්‍රාදේශීය ලේකම්ගේ සහයෝගය ලබාගෙන මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත දන්වන ලදි. | |
| 2 | මහඔය | **A-5 මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ මහඔය නගරයේ සිට 69 දක්වා මාර්ගය මංතීරු 4ක් දක්වා පුළුල්කොට සංවර්ධනය කිරීම**<br>(සභාපති, ප්‍රාදේශීය සභාව, මහඔය)<br>මාර්ග සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති බැවින්,මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන්ගෙන් මෙම ව්‍යාපෘතියට අදාළ අයවැය තුළින්ම මහඔය පදියතලාව මාර්ගය සංවර්ධනය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ බව ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති දයා ගමගේ මැතිතුමන් විසින් අවධාරණය කරන ලදි. එසේම, මහඔය සහ පදියතලාව ප්‍රධාන නගර ආසන්නව මෙන්ම 69 හංදියද මෙම මං තීරු 4 සහිතව සංවර්ධන කටයුතු සිදු කරන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත දන්වා සිටින ලදි. | දිස්ත්‍රික් ලේකම් - අම්පාර |
| 3 | මහඔය | **පුලාවල කරදාන වැව ප්‍රතිසංස්කරණය කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවස්ථාව නොදීම**<br>(සභාපති, ප්‍රාදේශීය සභාව, මහඔය)<br>ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති දයා ගමගේ මැතිතුමන් විසින් මේ පිළිබඳ විමසූ අවස්ථාවේ එම ස්ථානයේ කැලයක් පමණක් ඇති බවත් පවසන ලදි. එසේම,මෙම ස්ථානයේ වැවක් ස්ථාපිත කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව අවසර දිය හැක්කේ වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ට පමණක් බවත් මේ සඳහා තමන්ට බලයක් නොමැති බවත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට දැන්වූ බව අම්පාර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන අඩවි නිලධාරී විසින් පෙන්වා දෙන ලදි. එම අවස්ථාවේ ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමන් විසින්, ජල හිඟය උග්‍රව පවතින මෙම වකවානුව තුළ මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දීමට කටයුතු කරන මෙන් දැන්වූ අතර, කමිටුවේ අනුමැතිය ද ප්‍රකාශ කරන ලදි. | දිසා වන නිලධාරී,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 4 | පදියතලාව | **පදියතලාව ආයුර්වේද මධ්‍යස්ථානයේ සහ පදියතලාව ප්‍රාදේශීය රෝහලේ සේවය සඳහා සිවිල් ආරක්ෂක නිලධාරීන් යොදා ගැනීම සඳහා ඉල්ලීම**<br>***(ප්‍රාදේශීය ලේකම්- පදියතලාව)***<br>පදියතලාව ආයුර්වේද මධ්‍යස්ථානයේ හා ප්‍රාදේශීය රෝහල සඳහා තාවකාලික පදනම මත ආරක්ෂක නිලධාරීන් යොදා ගැනීම සඳහා ඉල්ලීමක් කරන ලෙසට ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරන මෙන් ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමන් විසින් දිස්ත්‍රික් ලේකම් තුමා වෙත පවසන ලදි. ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසල් කාසිම් මැතිතුමන් විසින් ප්‍රකාශ කර සිටියේ සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන් මේ සඳහා මුලින් යොදවා සිටි බවත්,පසුව එය විසුරුවා හැරිය බවත් ය. අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය තිලක් මහතා, මේ වන විට ආයුර්වේද රෝහල් හා ප්‍රාදේශීය රෝහල් වල කාන්තා සේවක බඳවා ගැනීම් විශාල වශයෙන් සිදුවන නිසා විශාල ගැටළු රාශියකට මුහුණ පෑමටසිදුවන බව පැවසීය. රෝහල් කාර්ය මණ්ඩලයේ පවතින මෙම ඌණ පූර්ණය පිරිමි කාර්ය මණ්ඩලය මගින් සම්පූර්ණ කරන්නේ නම් බොහෝ ගැටළුවලට විසඳුම් ලබාගත හැකි බව පැවසීය. එසේම, නැගෙනහිර පළාත් සභාවේ සභාපති චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා ප්‍රකාශ කර සිටියේ | අණ දෙන නිලධාරී සිවිල් ආරක්ෂක බලකාය |

| | | | |
|---|---|---|---|
| | | භාණ්ඩාගයෙන් මේ සඳහා අවසර ඉල්ලූ බවත්, ඒ සඳහා නැගෙනහිර පළාත වෙනුවෙන්ම 123 ක් පමණක් බඳවා ගැනීමට අවසර ලබා දී ඇති බවත්ය. එසේම, මධ්‍යම රජයෙන් මේ සඳහා ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් මෙම ගැටළු සහගත තත්ත්වය උදා වී ඇති බවද පෙන්වා දුන් අතර ඉදිරියේදී බඳවා ගැනීමේ ක්‍රමවේදයට සිදු වුවත් අවශ්‍යතාවයට අනුව සිදු නොවන බවද, වැඩි දුරටත් පෙන්වා දෙන ලදි. එම අවශ්‍යතාවන් අනුව, සම්පූර්ණ වාර්තාවක් සකස් කරන ලෙසට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමන් විසින් දැනුම් දෙන ලදි.<br><br>ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. කෝඩිෂ්වරන් මැතිතුමා විසින් තිරුක්කෝවිල් මූලික රෝහලේ යටිතල පහසුකම් ඉතාමත් පහත් මට්ටමක පවතින බවත්, මේ තත්ත්වය ඉතා ඉක්මනින් යථාතත්ත්වයට පත් කළ යුතු බව දන්වා සිටින ලදි. එමෙන්ම එම රෝහලේ ETE Unit හි කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ බවත්, පෙන්වා දෙන ලදි. එසේම, මෙම අඩු පහසුකම් හේතුවෙන් පසුගිය කාලයේ තිරුක්කෝවිල් රෝහලේ ප්‍රතිකාර ලැබූ පුද්ගලයෙකු මිය යාම හේතුවෙන් හා අදාළ යටිතල පහසුකම් සංවර්ධනය නොකිරීම යන කරුණු දෙක පදනම් කරගෙන ජනතා උද්ඝෝෂණ ව්‍යාපාර දෙකක් දියත් වූ මේ ආකාරයට මෙම ප්‍රශ්නය උග්‍රවන බැවින් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලා සිටින ලදි.<br><br>මෙම ව්‍යාපෘතිය මෙම වසර තුළ නිම කිරීම සඳහා ගරු. අමාත්‍ය දයා ගමගේ මැතිතුමන් විසින් අදාළ ප්‍රතිපාදන ලබා දෙන බවට පොරොන්දු වූ අතර ඊට අදාළ ඇස්තමේන්තුව ඉතා කඩිනමින් නම අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් තුමන් වෙත දැනුම් දෙන ලදි. | |
| 5 | දෙහිඅත්තකණ්ඩිය | දෙහිඅත්තකණ්ඩිය බස් නැවතුම් පොලේ හිමිකාරිත්වය පැවරීම සම්බන්ධයෙන් තීරණය කිරීම.<br>(දිස්ත්‍රික් ලේකම්).<br>දෙහිඅත්තකණ්ඩිය බස්නැවතුම් පලේ හිමිකාරිත්වය 2018.07.31 වන දින හිටපු දිසාපතිතුමන් විසින් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පවරා දුන් බව එහි ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. නමුත් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් මත හා දිස්ත්‍රික් ලේකම්තුමන් ගේ ඉල්ලීම මත දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් වෙත නැවත යතුරු භාරදුන් බව ප්‍රකාශ කරන ලදි.මෙම ගැටළුව මීලඟ කමිටු වාරයේ දී සාකච්ඡාවට ගන්නා බව ගරු සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද අතර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් විසින් කරන ඉල්ලීමට අනුව, පොදු වැසිකිළිවල යතුරු සභාවට භාර දීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටින ලදි. | දිස්ත්‍රික් ලේකම්, අම්පාර |
| 6 | ලාහුගල | ලාහුගල ප්‍රදේශයේ පානීය ජල ව්‍යාපෘතිය කඩිනම් කිරීම<br>(අග්‍රාමාත්‍ය කාර්යාලය.).<br>මේ සඳහා ප්‍රතිපාදන අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් සපයා ගත හැකි බව ගරු. අමාත්‍ය දයා ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද අතර මේ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම්, ලාහුගල/ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, අම්පාර |
| 7 | අම්පාර | වන අලින්ගෙන් සිදුවන හානි අවම කර ගැනීම සඳහා සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන් යොදවා ගැනීම<br>(දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.අයි.එම්.මන්සූර් මැතිතුමා) | අණදෙන නිලධාරී සිවිල් ආරක්ෂක බලකාය/ සහකාර අධ්‍යක්ෂ, වනජීවී සංරක්ෂණ |

| | | | |
|---|---|---|---|
| | | වන අලින්ගෙන් සිදුවන හානි අවම කර ගැනීමට සිවිල්ආරක්ෂක බලකායේ හා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පුහුණුවක් ලබා දී එම නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමෙන් මෙම ගැටළුවට යම් ආකාරයක විසඳුමක් ලබා ගැනීමට හැකි බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති එම්.අයි.එම්.මන්සූර් මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එසේම, දිසාපතිතුමන්ගේ නායකත්වයෙන් යුතුව මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදි. එසේම, සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති නෞෂාඩ් මහතා විසින් කැළෑ විනාශය තුළින් අලින් ගම් වදින බවත්, මෙම අලි මිනිස් ගැටුම හේතුවෙන් සිදුවන හානි සඳහා ක්ෂණික විසඳුමක් ලබාදීම සඳහා ප්‍රාදේශීය සභාවලට අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් සකස් කල යුතු බවත් පෙන්වා දෙන ලදි. ප්‍රාදේශීය සභාවලට අලිවෙඩි ලබා දීමට කටයුතු කරන ලෙසට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා විසින් දන්වන ලදි. ඒ සඳහා ඉතා ඉක්මනින් පියවර ගන්නා බව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවසන ලදි.<br>උහන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමා විසින් මෙම වන අලි ප්‍රශ්නය දැඩි ලෙස පවතින ප්‍රෙද්ශවල වීථි ලාම්පු සවි කිරිමට පියවර ගත යුතු බව ද ප්‍රකාශ කරන ලදි.නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එ් සඳහා කැළෑ ඉඩම් භාවිතයෙන් වල් අලින් ගම් වැදීමේ ප්‍රවණතාවය වැඩි වී ඇති බව ද ප්‍රකාශ කරන ලදි. | දෙපාර්තමේන්තුව |
| 8 | වෙනත් | වැලි සහ පතල් කැනීම් සඳහා බලපත්‍ර ලබා දීමේදී මතුවන ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම<br>(දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.අයි.එම්.මන්සූර් මැතිතුමා)<br>වැලි බලපත්‍ර ලබා දීමේදී ඇති වන අක්‍රමිකතා හේතුවෙන් පරිසර හානිය විශාල වශයෙන් සිදුවන බව දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.අයි.එම්.මන්සූර් මැතිතුමා විසින් පෙන්වා දුන් අතර මේ පිළිබඳ භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ ප්‍රාදේශීය කළමණාකරුගෙන් කරුණු විමසන ලදි. බලපත්‍ර කොන්දේසි කඩවීම් පිළිබඳ වාර්තා වනබවත් ඒ සඳහා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් යොදවා ඊට අදාළ පියවරයන් ගැනීමට කටයුතු යොදා ඇති බවත්, ප්‍රාදේශීය කළමණාකාරු ප්‍රකාශ කරනලදි. එසේම, හොර හා ව්‍යාජ බලපත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් දැනට නඩු විභාගවන බවත් එම නිසා යම් තාක් දුරට මෙම ක්‍රියාවලිය මර්දනය වී ඇති බවත් පැවසීය.<br>එසේම, වැලි බලපත්‍ර ලබා දිමේ දී අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ලබා දෙන බලපත්‍ර යොදාගෙන සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලි ප්‍රවාහණය කිරිමේ කටයුතු සිදු වන බවත්, මේ නිසා කුඹුරු,ඇළ මාර්ග හා මාර්ගයන් විනාශ වන බවත් පෙන්වා දෙන ලදි.මේ පිළිබඳ භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ නිලධාරීන් විසින් සොයා බැලිය යුතු බවද අවධාරණය කරන ලදි.මෙහි දි ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසාල් කාසිම් මැතිතුමා නැගු ප්‍රශ්නයකට පිළිතරු දෙමින් ප්‍රාදේශීය කලමණාකරු කියා සිටියේ තම ආයතනයේ නිලධාරින් දෙදෙනෙකු පමණක් සිටින බවයි. එම අවස්ථාවේ ගරු නියෝජ්‍ය ඇමතිතුමන් විසින් පෙන්වා දෙනු ලැබුවේ එම සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බවයි.<br>එමෙන්ම, වැලි ප්‍රවාහනය නවතා දිස්ත්‍රික්කය තුළ පමණක් වැලි බෙදා හැරීමට පියවර ගැනීම සුදුසු බවට ගරු සම සභාපති උදුමාලෙබ්බෙ මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. | ප්‍රාදේශීය කළමණාකරු, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |
| 9 | වෙනත් | වැලි බලපත්‍ර ලබා දීම සඳහා පිහිටුවා ඇති වැලි කමිටුව පිළිබඳ අක්‍රමිකතා රැසක් මා වෙත වාර්තා වී ඇති බැවින් ඉහත කමිටුව විසුරුවා හැරීමට යෝජනා කිරීම<br>*( ගරු සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමා)*<br>ඊලඟ සභා වාරයට කල් තබන ලදි. | දිස්ත්‍රික් ලේකම්, අම්පාර |

| | | | |
|---|---|---|---|
| 10 | අම්පාර | 2017 යල කන්නයේ වගා හානි සඳහා ගෙවිය යුතු වන්දි මුදල් ගෙවීම ප්‍රමාදවීම<br>(සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා<br>කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් තොරතුරු යැවීමට ප්‍රමාදවීම හේතුවෙන් වන්දි මුදල් ගෙන්වීම ප්‍රමාද වන බව ගරු සම සභාපති දයා ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.එහිදි මේ පිළිබඳ පසුගිය දිනවල සාකච්ඡා කළ බවත් මේ වන විට මිලියන 200 ක මුදලක් බැංකුගත කර ඇති බවත් දිසාපතිතුමන් විසින් ගරු සභාවට කරුණු දක්වන ලදි. මෙහිදි අක්කරයකට උපරිමය රු.40000.00ක මුදලක් ගෙවීමට අනුමත බවත් එයින් රු. 36000.00 මුදලක් ගෙවන බවත් කෘෂි රක්ෂණ මණ්ඩලයේ නියෝජිත මහතා පවසන ලදි. | සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය |
| 11 | අම්පාර | කෘෂි රක්ෂණ මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ගොඩනැගිල්ලක් ලබා දීම<br>***(ගරු සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමා)*** | සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය /දිස්ත්‍රික් ලේකම්, අම්පාර |
| 12 | අම්පාර | නව වලතාපිටිය ශ්‍රී නාවලන් විද්‍යාලය පිටුපස පිහිටි අක්කර 09 ක් වූ රජයේ ඉඩම 2018 වර්ෂය සඳහා ජාතික නිවාස අධිකාරිය මගින් ක්‍රියාත්මක උදා ගම්මානයක් ඉදිකිරීම කිරීම සඳහා කඩිනමින් නිදහස් කර ගැනීමට කටයුතු කිරීම<br>(සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා) | ප්‍රාදේශීය ලේකම්, සම්මන්ත්‍රණ/සහකාර අධ්‍යක්ෂ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, අම්පාර./සහකාර ඉඩම් කොමසාරිස්. |
| 13 | අම්පාර | නුවරගලතැන්න ප්‍රදේශයේ හඳුනාගත් හෙක්ටයාර් 240 ක රබර් වගාව සඳහා අලි වැට ඉදිකිරීම<br>(සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා) | සහකාර අධ්‍යක්ෂ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 14 | දෙහිඅත්තකණ්ඩිය | හිඟුරාණ සීනි සමාගමට අයත් මේ වන විට උක් වගා නොකර ඇති ඉඩම්වල මහ කන්නයේ (2018-2019) වී වගා කිරීමට අවසර ලබා ගැනීම<br>(ගරු. පළාත් පාලන,පළාත් සභා හා ක්‍රීඩා රාජ්‍ය ඇමතිණි, ශ්‍රීයාණි විජේවික්‍රම මැතිණිය)<br>ගරු ඇමතිතුමිය සභා වාරයට නොපැමිණීම හේතුවෙන් ඊ ළඟ සභා වාරයට කල් තබන ලදි. | විධායක නිලධාරි, ගල්ඔය වැවිලි සමාගම. |
| 15 | එරගම | ඉලුක්චේන,නියුගුණ හා සිංහපුර යන ප්‍රදේශවල දිගු කාලයක් සිට පදිංචිව සිටින ජනතාවට ඉඩම් බලපත්‍ර ලබා දීම.<br>(ප්‍රාදේශීය ලේකම්, එරගම)<br>එරගම ප්‍රාදේශීය ලේකම්තුමන් විසින් පෙන්වා දුන්නේ මෙම ජනතාව අවු. 50 කට අධික කාලයක් සීනි සමාගමට අයත් ප්‍රදේශයේ ජීවත් වන බව ය. එමෙන්ම, 28/04, යටතේ බලපත්‍ර සඳහාද ඉල්ලීම් කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.<br>මෙම ගැටළුව සඳහා දිසාපතිතුමන් ගේ මැදිහත් වීමෙන් ඉදිරියේ දී විසඳීමට පියවර ගන්නා බවට ප්‍රකාශ කර සිටියහ. | සහකාර ඉඩම් කොමසාරිස්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය, අම්පාර |
| 16 | එරගම | උළු කර්මාන්ත ශාලා කළමණාකරු විසින් පට්ටියාන්තවගෙන ප්‍රදේශයට යාමට ඇති පාලම වසා දැමීම.<br>(ප්‍රාදේශීය ලේකම්, එරගම)<br>දිසාපතිතමා,එරගම ප්‍රාදේශීය ලේකම්, වාරි මාර්ගඅධ්‍යක්ෂ හා උළු කර්මාන්ත ශාලාවේ කළමණාකරු යන නිලධාරීන් සාකච්ඡා කර මේ පිළිබඳ ව තීරණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව තීරණය විය. | කළමණාකරු,උළු කර්මාන්ත ශාලාව, එරගම. |

| | | | |
|---|---|---|---|
| 17 | | පාණ්ඩවට්ටෙහි 06 දෙනෙකු සඳහා ඉඩම් ලබා දීම.<br>(ප්‍රාදේශීය ලේකම්, එරගම)<br>එරගම ප්‍රාදේශීය ලේකම් විසින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මෙම ඉවත් කළ අයවළුන් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන ලෙසට 2014.07.14 වන දින පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීමක් කළ බවත්හා , එම ඉඩම් පරීක්ෂාව සඳහා වන සංරක්ෂණ දෙපාර්ථමේන්තුව දිනයක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදි.වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි මේ පිළිබඳ තමන් අදාල ඉඩම් හිමියන් 04 දෙනා සමග එම ඉඩම් පරීක්ෂාවට ගිය බවත් එසේ ගිය අවස්ථාවේ තවත් 04 දෙනෙකු එම ඉඩම් තමන්ට අයිති බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදි. එසේම තමන් ඒ පිළිබඳ පළාත් ඉඩම් කොමසාරිස් වෙත දන්වා යැවූ මුත් ඊට විසඳුමක් ලබා නොදුන් බව ප්‍රකාශ කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ-වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 18 | | එරගම ප්‍රදේශයේ අලිවැට ඉදිකිරීම<br>(ප්‍රාදේශීය ලේකම්, එරගම) | වාරිමාර්ග අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ-වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 19 | සම්මන්තුර | උළු කර්මාන්ත ශාලා කළමණාකරු දිගවම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී නොවීම<br>(ප්‍රාදේශීය ලේකම්, එරගම) | සහකාර අධ්‍යක්ෂ-වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

## 06.දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අවධානයට ලක්වූ සුවිශේෂී කරුණු

### 1. තිරුක්කෝවිල් ප්‍රදේශයේ පවතින් ඉල්මනයිට් කැනීම පිළිබඳ ගැටළුව (ගරු. පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.කෝඩීෂ්වරන් මැතිතුමා)

ඔලුවිල් ප්‍රදේශයේ සිට පොතුවිල් ප්‍රදේශය දක්වා මුහුදු තීරයේ සිදුවන මෙම ඉල්මනයිට් කැනීම මගින් මුහුදු ඛාදනය ඉතා බහුලව සිදුවන බව ගරු. පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.කෝඩීෂ්වරන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි. මුහුදු ඛාදනය හේතුවෙන් තිරුක්කෝවිල් ප්‍රදේශයේ කෝවිලකට හානි සිදු වූ බවත්, ඒ සඳහා වැලි ගෝනි 2000 ක් පමණ යොදා ගනිමින් තාවකාලික විසඳුමක් යොදාගත් බව තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් විසින් පෙන්වා දෙන ලදි. එසේම, මුහුදු ඛාදනය සම්බන්ධයෙන් නින්දවූර් ප්‍රදේශයේ ද තදින් බලපා ඇති බව ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍ය ෆයිසාල් කාසිම් මැතිතුමා වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි. මෙම ගැටළුව ඉතා තදින් ක්‍රියාත්මක වන බැවින් මේ සඳහා ඉතා කඩිනමින් විසඳුමක් ලබා ගත යුතු බව පෙන්වා දෙන ලදි.

### 2. පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඌරණිය ප්‍රදේශයේ පවතින උද්ඝෝෂණය පිළිබඳ (ගරු. නැගෙනහිර පළාත් සභා සභාපති චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා)

පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඌරණිය ප්‍රදේශයේ ජනතාව මේ වන විට දින කිහිපයට උද්ඝෝෂණක නිරතව සිටින බවත් එයට හේතුව පසුගිය යුධ වාතාවරණය හේතුවෙන් එම ප්‍රදේශයෙන් ඉවත් වූ ජනතාව නැවත තමන් ගේ ඉඩම් ලබාගැනීමට ය. එහෙත්, මේ වන විට ඌරණිය පාසල දක්වා භූමියේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගල් දමා සීමා වෙන් කර ඇති බව ගලප්පත්ති මැතිතුමා විසින් පෙන්වා දෙන ලදි. දැනට රජය මගින් ක්‍රියාත්මක වන නැවත පදිංචි කිරීමේ වැඩපිළිවෙළ අනුව මෙම පෞරාණික ඉඩම් ජනතාවට ලබා දීමට අවසර ලබා දෙන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලදි.

මෙහි දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී විසින් පෙන්වා දුන්නේ ගරු. පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.කෝඩීෂ්වරන් මැතිතුමා විසින් දෙසිය ගණනකට ඉඩම් නිදහස් කර දීමට කටයුතු කරන ලෙසට ය. මෙම ගැටළුව ඉඩම් කොමසාරිස් ජනරාල් සමග හෝ ජනාධිපති

තුමන්විසින් පත් කර ඇති කමිටුවට හෝ ඉදිරිපත් කර කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කරන බව දිසාපති තුමන්ව විසින් ප්‍රකාශ කරන ලදී.

### 3.දිස්ත්‍රික්කයේ පවතින මාර්ග සංවර්ධන කටයුතු පිළිබඳ

දිස්ත්‍රික්කයේ සිංහල දෙමළ මුස්ලිම් යන ජාතීන් 03 ම නියෝජනය වන ආකාරයට මේ සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කර ජනාධිපති තුමන් දැනුවත් කරන ලෙසට දිස්ත්‍රික් ලේකම් වෙත කමිටුව මගින් දැනුම් දෙන ලදී.

### 4. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වෙන දින පිළිබඳ

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වෙන දින පිළිබඳ මෙහිදී අවධානය යොමු කරන ලද්දේ ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසාල් කාසිස් මැතිතුමා විසිනි. මාසිකව පැවැත්විය යුතු කමිටු රැස්වීම නියමිත කාලය තුළ නොපැවැත්වීම හේතුවෙන් එක් කමිටු වාරයක් තුළ සාකච්ඡා කළ යුතු කරුණු රාශියක්ගොනු වන බවයි. ඒ අනුව, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් දැනුවත් කර ඇති දින යොදා ගෙන ඉදිරියේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කමිටුව විසින් තීරණය කරන ලද අතර මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2018.10.22 වන දින පැවැත්වීමට යොදා ගන්නා ලදී.

## 07.2018 වසර තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම

**2018 වසර තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය අධ්‍යක්ෂ සැලසුම්, කේ.පාක්‍යරාජා මහතාවිසින් ඉදිරිපත් කරන ලදී.**

ඒ අනුව, දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ විවිධ අමාත්‍යාංශ මගින් වෙන්කරන ලද රුපියල් මිලියන 669.56 ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 2049 ක් මේ වනවිට ක්‍රියාත්මක වන බව පෙන්වාදෙන ලද අතර ඒ ඒ සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ප්‍රගතිය ඉදිරිපත් කිරීම සිදුකරන ලදී.

| # | Name of Programs | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 1 | DCB – 2018 | 535 | 67.48 | 6.29 | - | 490 | 45 |
| 2 | PROGRAMME UNDER ONUR | 56 | 56.44 | 7.52 | 3 | 47 | 6 |
| 3 | *(RFEEP)* Reconciliation Focused Economic Empowerment & Social Infrastructure Development *UNDER State Ministry of National Unity & Co-Existence* | 46 | 114.48 | 16.05 | 5 | 26 | 49015 |
| 4 | *( RFEESP )* Strengthening Reconciliation Focused Economic Empowerment & Social Infrastructure Project *UNDER Ministry of National Integration Reconciliation and Official Languages* | 09 | 17.00 | - | 4 | 5 | - |
| 5 | RELIGIOUS PLACES | 93 | 40.11 | 8.59 | 22 | 55 | 16 |
| 6 | NUTRITION PROGRAMME | 164 | 1.74 | 0.04 | 111 | 51 | 2 |
| 7 | RESETTLEMENT | 1051 | 99.71 | 7.67 | 4 | 1007 | 40 |
| 8 | SPORTS | 16 | 26.10 | 0.51 | 11 | 5 | - |
| | | | | | | | |

- <u>DCB ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අයවැය අරමුදල් වැඩසටහන</u>

විමධ්‍යගත අයවැය අරමුදල් වැඩසටහන යටතේ දිගාමඩුල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 08 දෙනෙකු විසින් අම්පාර දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනය උදෙසා ව්‍යාපෘති යෝජනා 535ක් ඉදිරිපත් කරන ලද අතර වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 114.48 කි. ඒ අතරින් ව්‍යාපෘති යෝජනා 45 ක් මේ වන විට නිම කර ඇත. ක්‍රියාත්මක මට්ටමේ ව්‍යාපෘති 490 ද පවතී.

- <u>ආර්ථිකය සවිබලගැන්වීමේ වැඩසටහන (RFEEP)</u>

ආර්ථිකය සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10ක් වෙත යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ව්‍යාපෘති 46 ක් සඳහා රුපියල් මිලියන 99.97 ක් ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය මගින් වෙන්කර ඇති අතර එම ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බව වාර්තා වී ඇත.

| # | DS Division | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 1 | Kalmunai MD | 3 | 18.31 | 5.76 | - | 1 | 2 |
| 2 | Navithanveli | 1 | 2.20 | - | - | 1 | - |
| 3 | Sammanthurai | 10 | 7.90 | - | - | 10 | - |
| 4 | Irakkamam | 13 | 24.00 | 2.99 | 3 | 1 | 9 |
| 5 | Karaithivu | 2 | 4.00 | 1.70 | - | 1 | 1 |
| 6 | Ninthavur | 5 | 8.00 | 4.32 | - | 2 | 3 |
| 7 | Addalaichenai | 3 | 5.50 | 1.28 | - | 3 | - |
| 8 | Akkaraipattu | 3 | 4.89 | - | 1 | 2 | - |
| 9 | Alayadivembu | 4 | 27.88 | - | 1 | 3 | - |
| 10 | Thirukkovil | 2 | 11.80 | - | - | 2 | - |
| **TOTAL** | | **46** | **114.48** | **16.05** | **5** | **26** | **15** |

- <u>ආර්ථික සහයෝගීතා වැඩසටහන (ONUR)</u>

ආර්ථික සහයෝගීතා වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 18 ක ජීවනෝපාය හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘත 56 ක් සඳහා රුපියල් මිලියන 56.44 ක් වෙන්කර ඇති බව වාර්තා විය.

| **#** | **DS Division** | **No of Approved Projects** | **Approved Allocation (MN)** | **Expenditure (MN)** | **PROGRESS** | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | **Initial Stage** | **ON-Going** | **Completed** |
| 1 | Ampara | 4 | 7.08 | 2.38 | - | 3 | 1 |
| 2 | Damana | 5 | 7.85 | - | 3 | 2 | - |
| 3 | Uhana | 9 | 5.02 | 2.50 | - | 5 | 4 |
| 4 | Mahaoya | 9 | 13.18 | 0.18 | - | 9 | - |
| 5 | Lahugala | 5 | 6.95 | - | - | 5 | - |
| 6 | Kalmunai TD | 4 | 1.40 | - | - | 4 | - |
| 7 | Kalmunai MD | 2 | 2.15 | - | - | 2 | - |
| 8 | Navithanveli | 2 | 3.00 | 1.99 | - | 2 | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | Sammanthurai | 1 | 1.00 | - | - | 1 | - |
| 10 | Irakkamam | 3 | 1.60 | - | - | 3 | - |
| 11 | Karaithivu | 3 | 0.70 | - | - | 3 | - |
| 12 | Ninthavur | 1 | 0.50 | - | - | 1 | - |
| 13 | Addalaichenai | 1 | 0.50 | 0.47 | - | - | 1 |
| 14 | Akkaraipattu | 2 | 1.31 | - | - | 2 | - |
| 15 | Thirukkovil | 1 | 0.75 | - | - | 1 | - |
| 16 | Pottuvil | 1 | 1.20 | - | - | 1 | - |
| 17 | Padiyathalawa | 1 | 1.15 | - | - | 1 | - |
| 18 | Dehiyathakandiya | 2 | 0.75 | - | - | 2 | - |
| **TOTAL** | | **56** | **56.44** | **7.52** | **3** | **47** | **6** |

- <u>ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන</u>

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයයේ ප්‍රතිපාදන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පානම පලුගස්එරුම වැව සහ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 10ක් වෙන්වී ඇති බව වාර්තා විය.

| # | DS Division | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 01 | Lahugala | 01 ( *Renovation of Panama Palugaseruma Tank Including the Access Road* ) | 9.50 | 5.00 | | 01 | |
| **TOTAL** | | **01** | **9.50** | **5.00** | | **01** | |

- <u>ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන</u>

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එළුවන් බෝකිරීමේ ව්‍යාපෘතියක් සඳහා රුපියල් 4.35 බතික් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 23.875 ක මුදලක්ද වෙන්කර ඇති බව වාර්තා විය.

| # | DS DIVISION | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 1 | Sammanthurai | 1 | 4.350 | 4.35 (Goats Rearing Project) | | | 01 |
| 2 | Dehiyathakandiya | 4 | 3.905 | 23.876 | | | 4 |
| 3 | Uhana | 4 | 3.905 | | | | 4 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | Damana | 4 | 3.905 | (Training Program on Batik industry for 500 beneficiaries ) | | | 4 |
| 5 | Ampara | 4 | 3.905 | | | | 4 |
| 6 | Padiyathalawa | 1 | 0.976 | | | 1 | |
| 7 | MahaOya | 1 | 0.976 | | | 1 | |
| 8 | Lahugala | 2 | 1.952 | | | 2 | |
| **TOTAL** | | **21** | **23.875** | **7.226** | | **4** | **17** |

- Resettlement Development Projects (පුනරුත්තාපන සංවර්ධන වැඩසටහන)

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ යුධමය තත්වය මත අවතැන්වූ පුද්ගලයින් ඉලක්ක කරගනිමින් ජීවනෝපාය සංවර්ධන, සනීපාරක්ෂක පහසුකම්, ජලය හා විදුලි සැපයුම් ව්‍යාපෘති, වැව් ප්‍රතිසංස්කරණය කිරීම, කාන්තා මූලික පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම හා වැන්දඹු කාන්තාවන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ආදී වශයෙන් ව්‍යාපෘති 1051ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 99.71ක් වෙන්කර ඇති බව වාර්තා විය. ව්‍යාපෘති 40 අවසන් කර ඇති අතර 1007 ක් ක්‍රියාත්මක මට්ටමේ පවතී.

| # | DS Division | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 1 | Damana | 173 | 4.72 | 0.64 | - | 168 | 5 |
| 2 | Uhana | 163 | 5.16 | 1.08 | - | 158 | 5 |
| 3 | MahaOya | 112 | 4.90 | 0.60 | - | 112 | - |
| 4 | Lahugala | 80 | 6.97 | 0.31 | 1 | 79 | - |
| 5 | Navithanveli | 129 | 4.45 | 1.14 | - | 116 | 13 |
| 6 | Sammanthurai | 20 | 1.19 | 0.30 | - | 20 | - |
| 7 | Addalaichenai | 30 | 1.86 | 0.34 | - | 29 | 1 |
| 8 | Alayadivembu | 207 | 7.58 | 1.66 | 1 | 190 | 16 |
| 9 | Thirukkovi | 126 | 61.78 | 1.59 | 2 | 124 | - |
| 10 | Pottuvil | 11 | 1.10 | - | - | 11 | - |
| **TOTAL** | | **1051** | **99.71** | **7.67** | **4** | **1007** | **40** |

## RIDP (යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන)

යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනය උදෙසා ව්‍යාපෘති යෝජනා 535ක් ඉදිරිපත් කරන ලද අතර වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 114.48 කි. ඒ අතරින් ව්‍යාපෘති යෝජනා 45 ක් මේ වන විට නිම කර ඇත. ක්‍රියාත්මක මට්ටමේ ව්‍යාපෘති 490 ද පවතී

| # | DS Division | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 1 | Lahugala | 3 | 4.50 | 2.97 | | 1 | 2 |
| 2 | Kalmunai MD | 9 | 9.00 | | 9 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | Navithanveli | 1 | 1.50 | | 1 | | |
| 4 | Sammanthurai | 1 | 1.50 | | 1 | | |
| 5 | Sainthamaruthu | 7 | 7.00 | | 7 | | |
| 6 | Karaithivu | 1 | 1.50 | | 1 | | |
| 7 | Ninthavur | 6 | 60.00 | | 6 | | |
| 8 | Alayadivembu | 5 | 7.00 | | | 5 | |
| 9 | Thirukkovil | 6 | 7.00 | | 6 | | |
| TOTAL | | 39 | 99.00 | 2.97 | 31 | 6 | 2 |

## SPORTS (ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන)

ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන වැඩසටහන යටතේ අම්පාර ක්‍රීඩාපිටි සංවර්ධනය උදෙසා ව්‍යාපෘති යෝජනා 16 ක් ඉදිරිපත් කරන ලද අතර වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 26.10 කි. එම අතරින් ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක මට්ටමේ පවතී.

| # | DS Division | No of Approved Projects | Approved Allocation (MN) | Expenditure (MN) | PROGRESS | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Initial Stage | ON-Going | Completed |
| 1 | Ampara | 1 | 4.70 | - | - | 1 | - |
| 2 | Damana | 2 | 2.00 | - | 2 | - | - |
| 3 | Uhana | 3 | 3.00 | - | 3 | - | - |
| 4 | MahaOya | 1 | 1.00 | - | 1 | - | - |
| 5 | Kalmunai MD | 1 | 1.00 | - | 1 | - | - |
| 6 | Sammanthurai | 2 | 1.50 | - | 1 | 1 | - |
| 7 | Karaitivu | 2 | 2.50 | - | - | 2 | - |
| 8 | Nintavur | 1 | 1.00 | - | 1 | - | - |
| 9 | Addalaichenai | 1 | 1.00 | 0.51 | - | 1 | - |
| 10 | Alayadivembu | 1 | 7.40 | - | - | 1 | - |
| 11 | Dehiyathakandiya | 1 | 1.00 | - | 1 | - | - |
| TOTAL | | 16 | 26.10 | 0.51 | 11 | 5 | 0 |

## 06. හැඩඔය සංවර්ධන ව්‍යාපෘතිය හා මුන්දෙණිආරු සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරිපත් කිරීම ( ආචාර්ය කේ. වැලිගේපොළ මහතා - අධ්‍යක්ෂ (ජල සම්පත් සැලසුම්)

මෙහි දී හැඩඔය සංවර්ධන ව්‍යාපෘතියේ සැලැස්ම හා එහි පෝෂක ප්‍රදේශයන් පිළිබඳ සිතියම් ආශ්‍රයෙන් ඉදිරිපත් කළ අතර, මෙහි මූලික අභිමතාර්ථය වන්නේ යල කන්නයේ වී වගාව ඉහළ මට්ටමක සිදු කිරීමට ජලය සැපයීමයි. එසේම, මහ කන්නයේ ද මේ මගින් ජලය ලබා දීමට හැකි වන බවද වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි, මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇතත් 75% ක ප්‍රතිලාභ අම්පාර දිස්ත්‍රික්කය සතු වන බවත් පොතුවිල් හා ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මෙම ව්‍යාපෘතියට අදාළ භූමිය පිහිටා ඇති බව පෙන්වා දෙන ලදි. මෙහි ඇස්තමේන්තුව රු.මිලියන 12,500 ක් පමණ වන බව පෙන්වා දුන් අතර විදේශ ආධාර මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සිදු වන බවද සඳහන් කරන ලදි.

සිතියම් මගින් අදාළ භූමි ප්‍රදේශය හා එහි සංවර්ධන සැලැස්ම මෙහි දී ඉදිරිපත් කරමින් සංවර්ධන ව්‍යාපෘති වැව් 03 මේ සඳහා මූලික කරගෙන ක්‍රියාත්මක කිරීමට නියමිත බව පෙන්වා දුන් අතර රඹකැන්ඔය,කල්ඔඩෙයාරු හා මහඔය යන වැව් මීට යෝජනා කර ඇති බව පෙන්වා දෙන ලදි. දැනට රඹකැන්ඔය ජලාශය සංවර්ධනය කර ඇති අතර කල්ඔඩෙයාරු වැව මාදුරුඔය රක්ෂිතයේ පිහිටා ඇති

බැවින් එය සංවර්ධනය කිරීමේ දුෂ්කරතාවයන් ඇති බව පෙන්වා දෙන ලදි. ඒ අනුව, මුන්දෙනිආරු සංවර්ධන ව්‍යාපෘතිය තුලින් අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය හා පදියතලාව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකෙහි වගාවට සුදුසු ඉඩම් බොහෝ ප්‍රමාණයක් තිබෙන බැවින් මේ මගින් එය සපුරාගත හැකි බව ප්‍රකාශ කරන ලදි.

**කළුගල්ඔය සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳ ඉදිරිපත් කිරීම හා (ව්‍යාපෘති අධ්‍යක්ෂ ජබාර් මහතා)**

උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බණ්ඩරදූව ප්‍රදේශයේ මෙම සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර ගොවිතැන සඳහා අක්කර 1900 කට ජලය සැපයීම මෙම ව්‍යාපෘතියේ මූලික අභිමතාර්ථයයි. මෙහි දී එහි සැලැස්ම පිළිබඳව සිතියම් ආශ්‍රයෙන් ඉදිරිපත් කරන ලදි. මීටර 300 ක කුඩා වැව් බැම්මකින් සමන්විත වන අතර කි.මී 12ක් දකුණු ඇළ හා වම් ඇල කි.මී 4.5 ක් සංවර්ධනය කරමින් පවතින බව පෙන්වා දෙන ලදි. දැනට එහි සංවර්ධන කටයුුතු 80% කින් නිම කර ඇති බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.

**වන අලි මිනිස් ගැටුම් වළක්වාලීමට ගත් පියවර පිළිබඳ ඉදිරිපත් කිරීම සහ යෝජිත නව විදුලි වැට ඉදිකිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම**

**(වන ජීවි සහකාර අධ්‍යක්ෂ - අම්පාර)**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවවේ සහකාර අධ්‍යක්ෂ වෙනුවට එම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කළ කරුණු අනුව දිස්ත්‍රික්කයේ රක්ෂිත භූමි පිළිබඳ සිතියම් ආශ්‍රයෙන් ප්‍රථමයෙන් දක්වන ලදි. එසේම බොහෝ රක්ෂිතයන් හි අනවසර පදිංචිවීම් සිදු කර ඇති ආකාරයත්, වන අලි හා මිනිස් ගැටුම් පිළිබඳවත් දත්ත ඉදිරිපත් කරන ලදි. එසේම වන අලින්, 2009 සංඛ්‍යා ලේඛන තොරතුරු අනුව ලංකාවේ සංක්‍රමිණික අලි 5800 ක් පමණ සිටින බවත් එය මේ වන විට 7000 ක් පමණ වැඩි වී ඇති බව පෙන්වා දෙන ලදි. 2010 වර්ෂයේ මිනිස් මරණ12 ක් හා අලි මරණ 42 ක් සිදු වී ඇති බවත්, 2018 වර්ෂයේ අලි මරණ 38ක් හා මිනිස් මරණ 14 ක් සිදු වී ඇති බවත්,අලි මරණ සඳහා හේතුව වී ඇත්තේ හක්ක පටස් හා විදුලි සැර වැදීම් බව අනාවරණය කරන ලදි.
දැනට දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති අලි වැට සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අතර බොහෝ ප්‍රදේශවල ඉදිකරන ලද අලි වැට සම්බන්ධයෙන් අදාළ තොරතුරු මෙහිදී ඉදිරිපත් නොවීම හේතුවෙන් සියළුම තොරතුරු ඇතුළත් කර නිවැරදි තොරතුරු ඊ ළඟ කමිටු වාරයේ ඉදිරිපත් කරන ලෙසත් කමිටුව විසින් දන්වන ලදි. අනතුරුව දැනට යෝජිත දිස්ත්‍රික්කයේ අලි වැට යෝජනා සම්බන්ධයෙන් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි.

## 07. ස්තුති කථාව

අම්පාර දිස්ත්‍රික්කයේ සංවර්ධනය උදෙසා දක්වන ලද සහයෝගය වෙනුවෙන් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් කමිටුවට සහභාගී වී සිටි සම සභාපතිවරුන්ටත්, පාර්ලිමේන්තු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් සහ සියළුම රජයේ නිලධාරීන්ටත්, පොලිස් නිලධාරීන් ,රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්ටත් ,මාධ්‍යවේදීන්ටත්, අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා විසින් තම ස්තුතිය පළකර සිටීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ප.ව. 2.00 ට පමණ අවසන් විය.

ඩී.එම්.එල්.බණ්ඩාරනායක,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර

ඩී.එම්.එල්. බණ්ඩාරනායක
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර